# මිළඟ පාර්ලිමේන්තුව කුමක් සඳහා විය යුතු ද II

පසුගිය ලිපියෙහි අප කියා තිබූ කරුණක් වරදවා වටහාගත හැකි බැවින් ඒ පිළිබඳ සුළු විස්තරයක් කළ යුතු ය. 2004 පාර්ලිමේන්තුව පත්කෙරුණේ ජනතාව විසින් වුව ද චන්ද්‍රිකා - මංගල නායකත්වයට අවශ්‍යව තිබුණේ ඊළම කරා අප ගෙන යන සන්ධීය හෝ සහසන්ධීය හෝ රාජ්‍යයක් පිහිටුවීමට බව ඔවුහු නොදැන සිටියහ. බණ්ඩාරනායක යුවළගේ දියණිය එවැන්නක් කරාවි යැයි ඔවුහු නො සිතූහ. එහෙත් චන්ද්‍රිකා කරන්නේ කුමක් ද යන්න 1992 තරම් ඈත කාලයක සිට අපි දැන සිටියෙමු. ඇය එංගලන්තයෙන් ලංකාවට ගෙන ඒමට කටයුතු කළ අයට අවශ්‍ය වූයේ ඇය ලවා ශ්‍රී ල නි පක්ෂයේ ගමන් මග වෙනස් කරවීම ය. අපි ඒ දිනවල ම ඒ බව කීවෙමු. අප චින්තන පර්ෂදය ලෙසත් ම එ පෙරමුණ දේශපාලන පක්ෂයක් ලෙසත් මේ කරුණු දැන සිටියා පමණක් නොව චන්ද්‍රිකා පාර්ලිමේන්තුවේ දී පාලනය කිරීම සඳහා විකල්ප කණ්ඩායමක් පාර්ලිමේන්තුවට පත්කර යවන ලෙස ඉල්ලමින් අපි 1994 මහ මැතිවරණයේ දී තරග කෙළෙමු. එදා වෙනත් දේශපාලන පක්ෂවල සිටි ඇතැමුන් අද දිනේශ් ගුණවර්ධන මහතාගේ ජාතිකත්ව හා ඒකීය රාජ්‍ය දේශපාලනය අනුගමනය කරනු දැකීම සතුටට කරුණකි. එහෙත් ඔවුන්ගෙන් සමහරෙක් මහෞෂධ කුමරු මහෞෂධයක් අතින් ගෙන ඉපදුනාක් මෙන් තමන් ජාතිකත්ව දේශපාලනය උත්පත්තියේ සිට ගෙන එන ලදැයි සිතති. එසේ ඇඟවෙන අයුරින් ලියති. ඒ ගැන නම් අපට ඇත්තේ කණගාටුවකි. ඔවුන්ගේ ඒ අකෘතඥ දේශපාලනය කෙසේ වෙතත් ඒකීය රාජ්‍යයක් හා රටේ ස්වෛරිභාවය වෙනුවෙන් ඔවුන් දැන් පෙනී සිටීම අපි අගයමු.

චන්ද්‍රිකා - මංගල දෙමළ ජාතිවාදී විජාතික දේශපාලන ධාරාව ගැන 1992 පමණ සිට අප දැන සිටිය ද, අනුර දිසානායක ද 2004 පමණ වන විටත් මංගල සමග එකම දේශපාලනයක නිරත වී සිටි බැව් අපි එදා නොදැන සිටියෙමු. මංගල - ෆර්ඩිනන්ඩ්ස් - අනුර අක්ෂයක් දේශපාලනයේ ක්‍රියාත්මක වන බව දැනගැනීමට ලැබුණේ ඉන් පසුව ය. ජාතික බලවේගවල ශක්තිය නොවන්නට 2004 මැතිවරණයෙන් පසු චන්ද්‍රිකා - මංගල - අනුර අක්ෂය ඔස්සේ මෙරට සන්ධීය රාජ්‍යයක් පිහිටුවීමට ඉඩ තිබිණි. හිටපු මහවිනිසුරු සරත් සිල්වා චන්ද්‍රිකා කුමාරතුංගට දෙවැනි වර දිවුරුම් දීම පිළිබඳ දුන් උපදෙස්වලට පටහැණිව පසුව ක්‍රියාකළ බව අපි දනිමු. එමෙන් ම උතුර හා නැගෙනහිර වෙන්කිරීමට දුන් නඩු තීන්දුවේ තේමාවට පිටින් යන තීන්දු පසුව දුන්නේ ය. මේ අතරතුර කාලයේ මංගල - අනුර අක්ෂයේ ජනාධිපති අපේක්ෂකයා බවට ඔහු පත්වී සිටියේ ය. මංගල -අනුර -ෆර්ඩිනන්ඩ්ස් - ටිරාන් - සරත් සිල්වා දේශපාලන ධාරාවක් විවිධ දේශපාලන ක්‍රියාවල නිරතවීමට පටන්ගත්තේ ය. මංගල හා ජ වි පෙ ආණ්ඩුවෙන් කැඩී යැම මේ දේශපාලන ක්‍රියා මාර්ගවල එක් අවස්ථාවක් සනිටුහන් කෙළේ ය. එදා සිට ඔවුන්ට අවශ්‍ය වූයේ ආණ්ඩුව වැට්ටවීමට ය. එහෙත් මේ වන විට විවිධ හැල හැප්පීම්, කුඩුකේඩුකම් ආදිය මැද වුව ද ජාතිකත්ව දේශපාලනයක් මෙරට මුල් බැසගෙන තිබුණේ ය. හැඟීමෙන් සිංහල බෞද්ධකම ගැන කතාකළ ජාතික චින්තන ව්‍යාපාරය විශාල පිරිසකගේ සිත්සතන් තුළට කාවැදී තිබුණි. 1994 දී දේශපාලනුයේ තනිව ම ජාතිකත්ව ධජය ගෙන සටන්වැදි දිනේශ් ගුණවර්ධන මහතාට අමතරව පසුව විවිධ දේශපාලන පක්ෂ, පක්ෂ තුළ කණ්ඩායම්, ආදී වශයෙන් ජාතිකත්ව ධජය අතට ගනු දැකගන්නට හැකි විය. කලින් සඳහන් කළ දේශපාලන අක්ෂයට වැඩි දුර ගමනක් යැමට බැරි විය. ඒ අක්ෂය අද දෙකට තුනට කැඩී ඇත. අද සිංහල බෞද්ධයන්ගෙන් බොහෝ දෙනා හැඟීමෙන් සිංහල බෞද්ධයෝ වෙති. අනගාරික ධර්මපාල යුගයේ දී හා 1956 දී මෙන් ම නැවතත් සිංහල බෞද්ධ පුනර්ජීවනයක් දැකගත හැකි ය. අද පනස්හයට වඩා සිංහල බෞද්ධකම පිළිබඳ හැඟීමක් තිබුණ ද මේ පුනර්ජීවනය පවා තාවකාලික වූවක් බවට පත්විය හැකි ය. එසේ නොවීමට නම් සිංහල බෞද්ධයන්ගෙන් යම් පිරිසක් හැඟීමෙන් පමණක් නොව බුද්ධියෙන් ද සිංහල බෞද්ධයන් විය යුතු ය. අද හැඟීමෙන් සිංහල බෞද්ධයන් වන බොහෝ දෙනෙක් බුද්ධියෙන් යුදෙව් ක්‍රිස්තියානීහු වෙති. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ දාසයෝ වෙති. සිංහල බෞද්ධ සංස්කෘතියක බිහිකරන දැනුමක් ගැන මොවුන්ට හැඟීමක් පවා නැත. නිව්ටන්ලා ඩාවින්ලා අයින්ස්ටයින්ලා ඇඩම් ස්මිත්ලා වෙබර්ලා ෆ්‍රීඩ්මාන්ලා මාක්ස්ලා ඩූවීලා විට්ගන්ස්ටයින්ලා ෆොස්ටර්ලා රිචඩ්ස්ලා බෙන්ජමින්ලා හැරෙන්නට වෙනත් ලෝකයක් නැතැයි ඔවුහු සිතති.

ඉහත සඳහන් කළ දේශපාලන අක්ෂයට මුල දී අවශ්‍ය වූයේ රනිල් වික්‍රමසිංහ වෙනුවට සරත් සිල්වා ජනාධිපති අපේක්ෂකයා බවට පත්කිරීමට ය. එහෙත් 2009 ජූලි 10 වැනිදා පමණ සරත් ෆොන්සේකා අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලේ දී සුදු කොඩි සම්බන්ධයෙන් කරන ලද ප්‍රකාශයෙන් පසුව බටහිරයන් ඔහු තම අත් අඩංගුවට ගෙන ඇති බව පැහැදිලි ය. සුදු කොඩි රැගෙන ආ අයට වෙඩි තැබීය යන ඊනියා චෝදනාවෙන් ඔහු නිදහස් කිරීමට බටහිරයන් ඔහුගෙන් ඉල්ලන වන්දිය වී ඇත්තේ ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා ගෝඨාභය රාජපක්ෂ මහතා ශවීන්ද්‍ර සිල්වා මහතා ආදීන්ට එරෙහිව ඊනියා ජාත්‍යන්තර අධිකරණයේ ඔවුන්ගේ සාක්ෂිකරුවකු වීමත්

© Prof. Nalin De Silva

දේශපාලන වශයෙන් ජනාධිපතිතුමාට එරෙහිව ජ වි පෙ සමග "විප්ලව" කිරීමත් ය. සරත් ෆොන්සේකා ජනාධිපතිවරණයට ඉදිරිපත් වුයේත් අද ඔහු පාර්ලිමේන්තු මැතිවරණයට එක්වී සිටින්නේත් මාලිනී ෆොන්සේකා පරයන රංගනයක අනෝමා ෆොන්සේකා යෙදී සිටින්නේත් එහි ප්‍රතිඵලයක් ලෙසිනි. සරත් ෆොන්සේකා හමුදාව විසින් අත් අඩංගුවට ගනු ලැබීම පිළිබඳ ව සකලවිධ විජාතික බලවේග කම්පා වී සිටීම ගැන කිව හැක්කේ බටහිරයන් ඔහු අත්අඩංගුවට ගෙන ආණ්ඩු විරෝධී රාජ්‍ය විරෝධී හමුදා විරෝධී ස්ථාවරයකට ඔහු නොගෙනෙන්නට ඒ කිසිවක් නොවන බව ය. අද බටහිරයෝ බැන් කි මුන් ලවා ලංකාණ්ඩුවේ ඊනියා මානව හිතවාදී නොවන කරුණු ගැන උපදෙස් දීමට කමිටු පත්කිරීමට අර අදිති. නොබැඳි සමුළුව ඔස්සේ බැන් කි මුන් පරාජය කිරීමට කටයුතු කළ යුතු ය.

ඒ කෙසේ වුවත් විජාතික බලවේගවල තිර රචනය අනුව සියල්ල නො සිදුවෙයි. දේශපාලනයේ දී විවිධ බලවේග විවිධ ආකාරයෙන් ක්‍රියාකරනු බව පැහැදිලි ය. ජ වි පෙ හා මංගල සමග එක් වී සරත් සිල්වා ඔස්සේ අධිකරණමය වැඩ පිළිවෙළක් මගින් ආණ්ඩුව පෙරළීමට කටයුතු කළ බටහිරයන්ට ජාතික බලවේග පැරදවීමට නො හැකිවිය. ආණ්ඩුව කඩා වැටෙනු වෙනුවට ජ වි පෙ කැඩුණේ ය. සරත් ෆොන්සේකාට කොළඹ ඡන්ද තිබුණ ද, බටහිරයන් ජ වි පෙ (අනුර කුමාර සෝමවංශ කල්ලිය) හා මංගල ටිරාන් ආදීන් බලාපොරොත්තු නොවුණු අයුරින් ජාතික බලවේග විසින් සරත් ෆොන්සේකා පරාජය කෙරිණි. යම් අයුරකින් සරත් සිල්වා ජනාධිපති අපේක්ෂක වී නම් ඔහුගේ ඉරණම දියවන්නාවේ ගිලී යෑමට තිබිණි. පාර්ලිමේන්තු මැතිවරණය සමග මංගල ජ වි පෙන් වෙන් වී ඇත. දේශපාලන අත්දැකීම් ඇති මංගලට බටහිරයන්ට අවශ්‍ය වුව ද ජ වි පෙ සමග එක් වී කළ හැකි විප්ලවයක් නැති බව අවබෝධ වී ඇත. ඔහුට අද ඒ ජා පක්ෂයෙන් පිට දේශපාලනයක් නැත. එහෙත් දේශපාලන අත්දැකීම් නැති සරත් ෆොන්සේකාට අනෝමා ෆොන්සේකාට ටිරාන් අලස්ට (ඔහුට රනිල් සමග කොන්තරයක් පිරිමසා ගැනීමට ද ඇත) අර්ජුන රණතුංගට අනුව ජ වි පෙ සමග එක් වී ඊනියා විප්ලවයක් මගින් ආණ්ඩුව පෙරළා දැමිය හැකි ය.

අද වන විට බටහිරයෝ ජ වි පෙට සහාය දෙති. තව අවුරුදු කිහිපයකට මහින්ද රාජපක්ෂ ආණ්ඩුව මැතිවරණවලින් පරාජය කළ නොහැකි බව ඔවුහු දනිති. අද ඔවුන්ට රනිල් වික්‍රමසිංහගෙන් තවදුරටත් වැඩක් නැත. අප්‍රියෙල් අටවැනිදාට නියමිත මැතිවරණයෙන් ආණ්ඩුවට තුනෙන් දෙකක ජයක් ලැබීමට විශාල සම්භාවිතාවක් ඇත. සරත් ෆොන්සේකාට දළ වශයෙන් ගත්කළ ජාතිකත්ව ඡන්දවලින් 8%ක පමණ ප්‍රමාණයක් ලැබිණි. ඒ 8% න් ඉතා වැඩි ප්‍රමාණයක් මෙවර සන්ධානයට ලැබෙනු ඇත. ජනාධිපතිවරණයෙහි දී එ ජ නි සංධානයෙහි ඡන්ද 58% ක් පමණ වුව ද අපි නැවතත් පළාත් සභා මැතිවරණ ඡන්ද ප්‍රතිශතවලට යමින් සිටිමු. දිස්ත්‍රික්ක දහහතක ප්‍රසාද ආසන ද සන්ධානයට ලැබෙයි. මේ සියල්ලෙහි ප්‍රතිඵලයක් ලෙස ආණ්ඩුවට තුනෙන් දෙකක ජයක් ලැබීමට විශාල ඉඩකඩක් ඇත. යම් හේතුවක් නිසා එසේ නොලැබුණත් අවශ්‍ය ආසන කිහිපය මැතිවරණයෙන් පසු ආණ්ඩුව ලබාගනු ඇත. එහෙත් ඒ සඳහා අනවශ්‍ය අන්දමින් ඇමතිකම් දීමට සිදුවන බැවින් මුලදීම තුනෙන් දෙක ලබාදීම රටට හිතකර ය.

එහෙත් එහි දී ජනතාව මනාප දිය යුත්තේ කාහට ද යන ප්‍රශ්නය මතුවෙයි. මීළඟ පාර්ලිමේන්තුව කුමක් සඳහා ද යන ප්‍රශ්නය මතුවන්නේ එහි දී ය. පළමුවෙන් ම එක්සේසත් (ඒකීය) රාජ්‍යය ආරක්ෂා කරගැනීමේ ප්‍රශ්නය වෙයි. ඒකීය යන්න බටහිර සංකල්පයක් යැයි කියන්නවුනට අපේ එක්සේසත් යන්න පණ්ඩුකාභය කාලයේ සිට අප සතු සංකල්පයක් බව කිව යුතු ය. එක්සේසත් යන්න ඒකීය බවට වඩා වෙනස් වුවත් අපි දැනට ඒකීය යන වචනය යොදාගනිමු. චන්ද්‍රිකාගේ 2004 පාර්ලිමේන්තුවේ සිටි ඇතැමුන් තවමත් ඒකීය රාජ්‍යයකට පක්ෂ නැත. හැකිතාක් දුරට එවැන්නන්ට පාර්ලිමේන්තුවට එමට ඉඩ නොදිය යුත්තේ බටහිරයන්ගේ දෙමළ ජාතිවාදය පෝෂණය කිරීමේ අභිප්‍රාය සමග ගැටීම සඳහා ශක්තිමත් පාර්ලිමේන්තුවක් අප ජනාධිපතිතුමාට ලබාදිය යුතු බැවිනි. එහි දී එදා සිට ම ඒකීය රාජ්‍යය වෙනුවෙන් සටන් කළ දිනේශ් ගුණවර්ධන මහතා නායකත්වය දෙන ම එ පෙරමුණ, ශ්‍රී ල නි පක්ෂයේ බොහෝ මන්ත්‍රීවරුන්, ජා හෙළ උරුමය, ජා නිදහස් පෙරමුණ, අම්පාර දිස්ත්‍රික්කයේ සරත් වීරසේකර, අනුරාධපුර දිස්ත්‍රික්කයේ වෛද්‍ය චන්න ජයසුමන දිසානායක අපේ සිහියට නැගෙයි. එවැන්නන් හැකිතාක් පාර්ලිමේන්තුවට එවීමෙන් ජනතාව රට වෙනුවෙන් තම යුතුකම ඉටුකළා වනු ඇත. (මතු සම්බන්ධයි)

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva